**මහනුවර මහා නගර සභාව.**

**මහනුවර දිස්ත්‍රිකය**

**----------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**

**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

**---------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 25 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 මතය.**

**------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට මහනුවර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**----------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

**-----------------------**

**පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ)** 2014 දෙසැම්බර් 31 දිනට පැවති රු.22,983,102 ක් වටිනා නිදන් අරමුදල් 03 ක ශේෂය රු.22,889,880 ක් ලෙස අදාළ ගිණුම් වල ඇතුළත් කිරීම හේතුවෙන් රු.93,222 ක් ගිණුම් වල අඩුවෙන් දක්වා තිබුණි.

**(ආ)** සභාව සතු ප්‍රධාන පුස්තකාලයේ හා ශාඛා පුස්තකාල 06 ක පවතින රු.19,033,111 ක් වටිනා පොත් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) රු.15,902,381 ක් වටිනා කලින් ලැබීම් වලට අදාළ ගිණුම් ශේෂ 05 ක් අවිනිශ්චිත ගිණුම් යටතේ දක්වා තිබුණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්.**

**------------------------**

ගිණුම් විෂයයන් 08 කට අදාළ පාලන ගිණුම් අනුව, ශේෂයන්ගේ එකතුව රු.409,844,946 ක් වූ අතර, උපලේඛන අනුව, ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.335,835,050 ක් වූයෙන්, රු.74,009,896 ක වෙනසක් නිරීක්ෂණය විය.

**1.3.3 ලැබියයුතු ගිණුම්.**

**--------------------**

2014 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂ 02 ක එකතු වටිනාකම රු.43,979,985 ක් වූ අතර, මෙම ශේෂයන් අවුරුදු 10 ක කාලයක් ඉක්මවා තිබූ ශේෂයන් විය.

**1.3.4 ගෙවියයුතු ගිණුම්.**

**-------------------------**

2014 දෙසැම්බර් 31 දිනට ගිණුම් ශේෂ 03 ක එකතුව රු.534,045,489 ක් වූ අතර, එම ගෙවියයුතු ගිණුම්ශේෂවල වටිනාකමින් රු.492,883,875 ක් වියදම් ණයහිමියෝ විය. එයින්, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතුව රු.225,529,305 ක් විය.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

**--------------------------------**

2014 දෙසැම්බර් 31 දිනට එකතු කළ අගය මත බදු ගිණුමේ පැවති රු.12,760,491 ක් වූ ශේෂ වටිනාකම තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය උපලේඛන විගණනයට ඉදිරිපත් නොවුණි.

**1.3.6 නීති, රීති හා රෙගුලාසී ආදියට අනුකූල නොවීම.**

**-----------------------------------------------**

**පහත සඳහන් නීති, රීති හා රෙගුලාසීවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.**

**(අ)** රු.1,773,745 ක් වටිනා තැන්පතු විෂයයන් 477 ක් සම්බන්ධව ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 571(2) අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ දෙපාර්තමේන්තු 12 ක 2014 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ කටයුතු ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 756 හා 757 ප්‍රකාරව 2015 ජුනි 30 දින වන විටත් නිම කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය.**

**----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**--------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.347,248,051 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.229,972,207 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵල වල රු.117,275,844 ක වර්ධනයක් දක්නට ලැබුණි.

**2.2 මූල්‍ය පාලනය**

**------------------**

**(i)** බැංකු ගිණුම් 02 ක බැංකුගත කළත්, උපලබ්ධි වී නොතිබුණු රු.7,943,744 ක් වටිනා ණයපත් ලැබීම්, චෙක්පත්, මුදල් හා අඩුවෙන් තැන්පත් කිරීම් අවස්ථා 241 ක් සම්බන්ධයෙන් හේතු සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ii)** බැංකු ගිණුම් 02 ක 2012 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා හඳුනා නොගත් බැර ශේෂවල වටිනාකම රු.17,535,578 ක් වූ අතර, හඳුනා නොගත් හර ශේෂවල වටිනාකම රු.2,020,587 ක් විය.

**2.3** **ආදායම් පරිපාලනය**

**----------------------**

**2.3.1** **වරිපනම් බදු**

**---------------**

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

i. සමාලෝචිත වර්ෂය ආරම්භයේ දි, රු.114,086,538 ක හිගයක් පැවති අතර, වර්ෂයේ බිල් කිරීම් රු.270,978,811 ක් විය. වර්ෂයේ අය කිරීම් හිගයෙන් සියයට 35 ක් හා බිල් කිරීම්වලින් සියයට 75 ක් වූයෙන්, 2014 දෙසැම්බර් 31 දිනට රු.145,611,673 ක ශේෂයක් අය වියයුතුව තිබුණ නමුත්, ඒ සම්බන්ධයෙන් මහා නගර සභා ආඥා පනතේ 242 වගන්තියේ විධිවිධාන අනුගමනය කර හිග ආදායම් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

ii. ගිණුමට අනුව සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට වරිපනම් බදු ශේෂය රු.145,611,674 ක් වු අතර, විගණනයේ දි, නාගරික කොමසාරිස් විසින් දෙන ලද තොරතුරු අනුව, ශේෂය රු.143,344,394 ක් වූයෙන්, රු.2,267,280 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.3.2** **ජල ගාස්තු.**

**------------**

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

i. සමාලෝචිත වර්ෂය ආරම්භයේ දි රු.91,313,547 ක හිගයක් පැවති අතර, වර්ෂයේ බිල් කිරීම් රු.485,757,091 ක් විය. ඉන් වර්ෂයේ අය කිරීම හිගයෙන් කොපමණ ද, යන්න හා බිල් කිරීම්වලින් රැස් කිරීම් කොපමණ ද, යන්න පිළිබඳ විගණනයට තොරතුරු ඉදිරිපත් නොවීණි.

ii. ගිණුමට අනුව,සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට හිග හිටි ජල ගාස්තුව රු.92,647,416 ක් වු අතර, ජල කර්මාන්ත දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, ශේෂය රු.91,313,547 ක් වූයෙන්, රු.1,333,869 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.3.3** **වෙනත් ආදායම්.**

**-------------------**

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

i. සමාලෝචිත වර්ෂය ආරම්භයේ දි, ආදායම් විෂයයන් 08 ක එකතුව රු.43,903,011 ක හිගයක් පැවති අතර, වර්ෂයේ බිල් කිරීම් රු.214,744,555 ක් විය. වර්ෂයේ අය කිරීම් බිල් කිරීම් වලින් සියයට 63 ක් වූයෙන්, 2014 දෙසැම්බර් 31 දිනට රු.78,771,072 ක මුදලක් හිඟ හිට තිබුණ නමුත්, එම හිඟ ආදායම් අයකිරීමට කටයුතු කර නොතිබුණි.

ii. ගිණුමට අනුව, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට හිග හිටි වෙනත් ආදායම් රු.183,458,940 ක් වූ අතර, සභාව විසින් දෙන ලද තොරතුරු අනුව, ශේෂය රු.78,771,072 ක් වූයෙන්, රු.104,687,868 ක වෙනසන් නිරීක්ෂණය විය.

**2.3.4** **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**------------------------------**

(i) පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.2,856,076 ක් හා මුද්දර ගාස්තු රු.52,769,066 ක් ලැබියයුතුව පැවතුණි.

(ii) ගිණුමට අනුව, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට හිග හිටි උසාවි දඩ රු.2,856,076 ක් වූ අතර, නාගරික කොමසාරිස් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, ශේෂය රු.1,156,326 ක් වූයෙන්, රු.1,699,750 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.3.5 තානායම් කුලී**

----------------

බදු කුලී යටතේ 2014 දෙසැම්බර් 31 දිනට හිග හිටි තානායම් කුලී රු.9,178,732 ක් දක්වා තිබූ අතර, නාගරික කොමසාරිස් ඉදිරිපත් කළ තොරතුරු අනුව, වර්ෂය අවසානයේ හිග හිටි ශේෂය රු.7,178,732 ක් වූයෙන්, රු.2,000,000 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

**2.3.6 බදු කුලී**

--------

ගිණුමට අනුව, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට හිඟ හිටි බදු කුළිය රු.99,080,287 ක් වූවත්, ඉදිරිපත් කර ඇති උපලේඛනය අනුව හිඟ හිටි බදු කුළිය රු.101,080,287 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය.**

---------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා.**

----------------------------------

(අ) 2014 දෙසැම්බර් බැංකු සැසඳුම් වාර්තාවට අනුව, අගරු චෙක්පත් 37 ක් පැවති අතර, එයින් රු.171,696 ක් වටිනා චෙක්පත් 14 ක ශේෂ වසර 01 ත් වසර 05 ත් දක්වා කාලයක සිට ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ආ) 2003 වර්ෂයේ අනතුරට පත් අංක 253 – 3800 වාහනය සම්බන්ධයෙන් සිදු වී ඇති රු.380,460 ක පාඩුව අය කර ගැනීමට හෝ සුදුස්සක් කිරීමට කටයුතු කිරීමකින් තොරව ගිණුම්වලින් ඉදිරියට ගෙනවිත් තිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා.**

---------------------------

2008 – 2013 කාල පරාසයට අදාළ අවස්ථා 25 කදී ලබා දී තිබුණු එකතුව රු.4,581,493 ක් වටිනා අත්තිකාරම් මුදල් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ දී අවස්ථා 07 කදී ලබා දී තිබුණු එකතුව රු.637,177 ක් වටිනා අත්තිකාරම් මුදල් 2015 ජූනි 30 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි.

**3.3 අවිධිමත් ගනුදෙනු**

-----------------------

**(අ) දුරකථන බිල්පත් ගෙවීම**

-------------------------

නිලධාරීයෙකුගේ නිල නිවාස දුරකථන බිලෙහි 2014 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදයට අදාළ රු.7,710 ක පියෝ ටී.වී. (PEO TV) බිල්පත් 2010 සැප්තැම්බර් 01 දිනැති අංක 446 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ (2 ) ඡේදයේ නියමයන්ට පටහැනිව සභාව විසින් ගෙවා තිබුණි. සභා නිලධාරීන් 23 දෙනෙකුට 2013 හා 2014 වර්ෂවල දි, ඒකාබද්ධ සීමාව ඉක්මවා දුරකථන වියදම් වශයෙන් එකතුව රු.33,075 ක් ගෙවා තිබුණි.

ජාත්‍යන්තර සෘජු දුරකථන පහසුකම් සඳහා වන ගාස්තු ගෙවිය හැකි වන්නේ ඒ සඳහා අවශ්‍ය අනුමැතිය අදාළ අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් ලබා ගෙන තිබුණේ නම්, පමණක් වුවත්, එසේ අනුමැතිය ලබා නොගත් නිලධාරීන් දෙදෙනෙකුගේ නිල නිවාස දුරකථනයේ ජාත්‍යන්තර දුරකථන ඇමතුම් සඳහා 2014 වර්ෂයේ දි රු.4,649 ක් ගෙවා තිබුණි.

**(ආ)** **<u>සභා රැස්වීම් දීමනා ගෙවීම</u>**

මහා නගර සභා අඥා පනතේ 289(2) වගන්තියේ විධිවිධාන අනුව සාදන ලද කිසිම නියෝගයක් පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලබනතුරු සහ ඒ අනුමැතිය ගැසට් පත්‍රයේ පළ කරනු ලබනතුරු වලංගු නොවන බව සඳහන්ව තිබිය දී, ඒ පිළිබඳ සැළකීමකින් තොරව මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අංක සීපීසී/සීඑම්එස්/01/06/01/4-4 දරන ලිපියට අනුව, 2014 පෙබරවාරි 17 සිට 2014 දෙසැම්බර් 31 දක්වා කාලයට අදාළව සභා රැස්වීම් හා කමිටු දීමනා වශයෙන් රු.1,259,000 ක් සභාවේ සභිකයින් වෙත ගෙවා තිබුණි.

**(ඇ)** **ගුවන් ගමන් යානා පත්‍ර ගාස්තු**

**---------------------------------**

සාකච්ඡා, සම්මන්ත්‍රණ, පුහුණු වැඩසටහන් ඇතුළු සියලු රාජකාරි ගමන් සඳහා විදේශගත වන සියලුම නිලධාරීන් කුමන අරමුදල්වලින් වියදම් දැරුව ද, සිය ගුවන් ගමන් යානා පත්‍ර, 2008 අප්‍රේල් 24 දිනැති අංක 431 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන අනුව ශ්‍රී ලංකන් එයාර්ලයින් සමාගම හෝ මිහින් ලංකා (පුද්ගලික) සමාගම වෙතින් පමණක් මිල දී ගතයුතු බව දක්වා ඇතත්, ඊට පටහැනිව විදේශ සංචාර 03 ක් සඳහා රු.487,610 ක් වැය කර යානාපත්‍ර වර්ල්ඩ් එයාර් ප්‍රයිවෙට් ලිමිටඩ් ආයතනයෙන් මිල දී ගෙන තිබුණි**.**

**3.4** **සේවක ණය**

**----------------**

**පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.**

**(i)** 2004 සිට 2013 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ මිය ගිය හා විශ්‍රාම ගිය සේවකයින් 24 දෙනෙකුගෙන් අය වියයුතු රු.1,585,992 ක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) ස්ථාන මාරු වී ගිය නිලධාරීන් හා සේවකයින් 156 දෙනෙකුගෙන් 1999 සිට 2014 ජූලි දක්වා අය වියයුතු රු.794,983 ක ණය ශේෂ අය කර ගෙන නොතිබුණි.

(iii) ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 22 දෙනෙකු විසින් වැඩිපුර ගෙවා තිබුණු රු.77,557 ක ණය මුදල් සමාලෝචිත වර්ෂය තුළ දී නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iv) 2009 සිට 2014 දක්වා කාල පරිච්ඡේදය තුළ සේවය අත හැර ගොස් ඇති නිලධාරීන් 07 දෙනෙකුගෙන් රු.346,836 ක ණය ශේෂයක් නිරවුල් කර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

(v) වැඩ තහනම් කළ නිලධාරීන් 14 දෙනෙකුගේ රු.650,337 ක් වටිනා ණය ශේෂයක් 2014 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(vi) සුනාමි ව්‍යසනයෙන් අතුරුදහන් වූ නිලධාරිනියකගේ රු.74,464 ක ණය ශේෂය සම්බන්ධව විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි.

**3.5** **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

**---------------------------------------------**

**පහත සඳහන් කරුණු නිරික්ෂනය කරනු ලැබේ.**

**(අ)** මහනුවර මහාධිකරණයෙන් රාජසන්තක කරන ලද මහා නගර සභාවේ කාර්මික වැඩපළේ රඳවා තබන ලද වටිනාකම හඳුනා ගෙන නොතිබූ වාහන 04 ක් ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කරන නොතිබුණු අතර, ඊට අදාළ අළුත්වැඩියාවන් කර ප්‍රයෝජනවත් කාර්යයකට යොදවා ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

(ආ) මධ්‍යම පළාත් සභාවෙන් ලැබී තිබූ පිම් ට්‍රැක්ටරය සහ ගිනි නිවන අංශයේ නිසාන් සලීම් යන වාහන 02 ක 2014 ජනවාරි 01 දින කාර්මික වැඩපලට භාර දී තිබුණ ද 2014 පෙබරවාරි 10 දින වන විටත් අළුත්වැඩියාවන් ආරම්භ කර නොතිබූ අතර, මෙම වාහන 02 ක ද ලියාපදිංචි කර නොතිබුණි.

(ඇ) 2013 වර්ෂයේ සිට 2014 ජනවාරි මාසය දක්වා අලුත්වැඩියා සඳහා කාර්මික වැඩපළට භාර දුන් වාහන 10 ක් අලුත්වැඩියා නොකර දින 01 සිට දින 79 ක කාල පරාසයක් තුළ කාර්මික වැඩපළෙහි රඳවා තබා ගෙන තිබුණි.

**3.6 කොන්ත්‍රාත් පරිපාලනය.**

---------------------------

වරිපනම්, මිශ්‍ර ආදායම් හා ගබඩා කටයුතු පරිගණකගත කිරීමේ ටෙන්ඩර් දැන්වීම අනුව, පළාත් පාලන ආයතන සඳහා පරිගණක මෘදුකාංග සැපයීම පිළිබඳව වසර 10 කට වඩා පළපුරුද්දක් ඇති ආයතනවලින් මිල ගණන් කැඳවා ඇතත්, ස්ථාපනය කර වසර 05 කට වඩා අඩු කාලයක් වූ පුද්ගලික සමාගමක් වෙත රු.1,075,000 ක් වූ ටෙන්ඩරය පිරිනමා තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.**

-----------------------------------------

**අයවැය පාලනය.**

------------------

**පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

(අ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේ දි ආදායම් විෂයයන් 02 ක සියයට 18 සිට සියයට 81 ක් දක්වා ද, වියදම් විෂයයන් 07 ක සියයට 16 සිට සියයට 52 ක් ඉක්මවා ද විචලනයක් නිරීක්ෂණය වු බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබු බව නිරීක්ෂණය විය.

(ආ) නිසි සැළසුමකින් හා නිසි අවධානයකින් තොරව හා අවශ්‍යතා හදුනා නොගෙන ප්‍රතිපාදන වෙන් කරවා ගැනීම හේතුවෙන්, ප්‍රාග්ධන වැය විෂයයන් 16 ක රු.29,900,000 ක් වු ප්‍රතිපාදන සියයට සීයයක්ම ඉතිරි වී තිබුණි.

(ඇ) ප්‍රාග්ධන වැය විෂයයන් 14 ක ඇස්තමේන්තු ප්‍රතිපාදනයන් ඉක්මවා සියයට 16 සිට සියයට සියය ඉක්ම වු එකතුව රු.64,632,863 ක මුදලක් උපයෝජනය කර තිබුණි.

(ඈ) ප්‍රාග්ධන වැය විෂයයන් 17 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනවලින් සියයට 51 සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

**5. පාලන හා පද්ධති**

--------------------

**පහත සඳහන් පාලන හා පද්ධති ක්ෂේත්‍රයන් සභාවේ අවධානය යොමු කරනු ලැබේ.**

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය